ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත්කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01හි 63(ඉ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අගයන් ඉදිරිපත් කිරීමේදී වැටයීම් මට්ටම් භාවිතාකළ යුතු වුව ද, 2024 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ වටිනාකම් ශතවලින් දක්වා තිබුණි.	ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී අගයන්හී වැටයීම් මට්ටමට පිළියෙළ කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	යොමුගත ප්‍රමිතය ප්‍රකාරව වැටයීම් මට්ටම භාවිතා කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07හි 47 ඡේදය ප්‍රකාරව සාධාරණ වටිනාකමෙහි සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් පමණක් තිබෙන දේපළ, පිරියත හා උපකරණ අයිතම සෑම වර්ෂ 03කට හෝ 05කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් මෝටර් වාහන හැර අනෙකුත් පිරිවැය රු.103,965,189ක් වූ දේපළ, පිරියත හා උපකරණ ආසන්න වර්ෂ 05 තුළ දී ප්‍රත්‍යාගණනයකර නොතිබුණි.	සටහන්කර ගතිමි. ආයතනයේ සියලුම ස්ථාවර වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට තීරණය කොට ඇති අතර, ඒ අනුව නව ප්‍රත්‍යාගණන වටිනාකම පොත්වල සටහන් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	යොමුගත ප්‍රමිතය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ අගය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුකරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන්	සටහන්කර ගතිමි. ආයතනයේ සියලුම ස්ථාවර වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට තීරණය කොට ඇති අතර, ඒ අනුව නව ප්‍රත්‍යාගණන වටිනාකම	යොමුගත ප්‍රමිතය ප්‍රකාරව වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය

වන දිනයේ දී සමාලෝචනය කළ යුතු වුවත්, 2024 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වී අවසන් පිරිවැය රු.38,321,172ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනයකර නොතිබුණි. ඒ අනුව, එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුව ද, එසේ සිදුකර නොතිබුණි.	පොත්වල සටහන් කිරීමෙන් පසුව අදාළ වත්කම්වල අවශේෂ අගය සහ ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	කිරීමට කටයුතු කළ යුතු ය.

1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොඩනැගිලි වටිනාකම	41,606,860	45,727,010	4,120,150	කොමිෂන් සභාවට අයත් ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන ඒවා ප්‍රත්‍යාගණනය කිරීමට අදාළව කටයුතු සිදු කිරීමට සැලසුම්කර ඇති අතර, ආයතනයට නීත්‍යානුකූල අයිතියක් ඇති ස්ථාවර වත්කම් පමණක් ලෙජර් ගිණුම්වල සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. මෙමගින් වත්කම් ලේඛනය සහ ලෙජර් ගිණුම්වල පවතින විෂමතාවයන් මෙමගින් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වූ වටිනාකම් අනුරූපී වාර්තා සමග සැසඳිය යුතු ය.
(ආ)	පරිගණක, ප්‍රින්ටර්, ජංගම දුරකතන හා ලැප්ටොප් පරිගණක යන වත්කම් කාණ්ඩයේ වටිනාකම	39,531,930	40,874,755	1,342,825	කොමිෂන් සභාවට අයත් ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන ඒවා ප්‍රත්‍යාගණනය කිරීමට අදාළව කටයුතු සිදු කිරීමට සැලසුම්කර ඇති අතර, ආයතනයට නීත්‍යානුකූල අයිතියක් ඇති ස්ථාවර වත්කම් පමණක් ලෙජර්	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වූ වටිනාකම් අනුරූපී වාර්තා සමග සැසඳිය යුතු ය.

ගිණුම්වල සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. මෙමගින් වත්කම් ලේඛනය සහ ලෙජර් ගිණුම්වල පවතින විෂමතාවයන් මෙමගින් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පිරියත හා උපකරණ	382,679	විස්තරාත්මක උපලේඛන	මෙම වත්කම් 2024 වන විට සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන් වේ. පවතින ස්ථාවර වත්කම් ලේඛනයේ අඩුපාඩු මගහරවා ගැනීමට සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තුවල පවත්නා අඩුපාඩු මගහරවා ගැනීමට 2025 වර්ෂයේ දී කටයුතු කරන අතර, ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කොට නඩත්තු කිරීමට සටහන්කොට ගතිමි.	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක් වූ වටිනාකම් සඳහා අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම.
(ආ)	කාර්යාල උපකරණ, පරිගණක, ගෘහභාණ්ඩ	15,656,035	විස්තරාත්මක උපලේඛන	මෙම වත්කම් 2024 වන විට සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන් වේ. පවතින ස්ථාවර වත්කම් ලේඛනයේ අඩුපාඩු මගහරවා ගැනීමට සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තුවල පවත්නා අඩුපාඩු මගහරවා ගැනීමට 2025 වර්ෂයේ දී කටයුතු කරනු ලැබේ. අදාළ වත්කම් හඳුනාගැනීම, මැනීම සිදුකොට යෝග්‍ය ස්ථාවර වත්කම් ලේඛනයක් සකස්කොට නඩත්තු කිරීමට සටහන්කොට ගතිමි.	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක් වූ වටිනාකම් සඳහා අදාළ ලේඛන අවශ්‍යතාවය අනුව විගණනයට ඉදිරිපත් කළ යුතු වීම.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට වූ රු.6,673,222ක ගෙවිය යුතු ශේෂ කාලවිශ්ලේෂණයට අනුව, අවුරුදු 01ට අඩුශේෂ රු.5,442,797ක් ද, අවුරුදු 01ත් 02ත් අතර ශේෂ රු.5,461ක් ද, අවුරුදු 02ත් 03ත් අතර ශේෂ රු.547,681ක් ද, අවුරුදු 05ට වැඩි ශේෂ රු.677,283ක් ද වූ අතර, එම ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි.	කල්ඉකුත් වූ ශේෂ නිරවුල් කිරීමට අදාළව ආයතනයේ ඉදිරි කළමනාකරණ හා විගණන කමිටුවෙන් නිර්දේශ ලබාගැනීමට නියමිත ය.	ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය.

1.7 නීතිරීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීතිරීති රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනතේ 4(එ) වගන්තිය	නීති ආධාර සැපයීමෙහිලා වූ යම් අංශයක් සම්බන්ධයෙන් පර්යේෂණාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වුවත්, එසේකර නොතිබුණි.	කොමිෂන් සභාවේ නීති නිලධාරින් බොහෝ පිරිසක් මේ වන විට පශ්චාත් උපාධි හදාරමින් සිටින අතර, ඔවුන්ගේ පර්යේෂණ නිබන්ධන සඳහා නීති ආධාර පිළිබඳ ක්ෂේත්‍රයන් පාදකකර ගනිමින් සිටියි. ඒ අනුව ඉදිරියේ දී නීති ආධාර පිළිබඳ පර්යේෂණ කෙරෙහි අවධානය යොමුකිරීම සිදුවේ. තව ද, පර්යේෂණ සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන්කිරීමේ හැකියාවක් නොපැවතීම මත ද මෙම පර්යේෂණ සිදුකිරීම අතපසු වී ඇත.	යොමුගත පනත අනුව පර්යේෂණාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	1982 අංක 43 දරන මුද්දර බදුපනත	රු.25,000ට වැඩි ගෙවීම් සඳහා රු.25ක මුද්දර ගාස්තුවක් අයකළ යුතු වුවත්, අවස්ථා 13ක දී රු.590,592ක් වටිනාකමැති ගෙවීම් සඳහා එසේ අයකර ගෙන නොතිබුණි.	අදාළ මුද්දර බදු අයකොට එය දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරනු ලැබේ.	යොමුගත පනත අනුව මුද්දර බදු අයකිරීමට කටයුතු කළ යුතු ය.

(ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

(i) මු.රෙ.237(අ) (1)	සිදුකරන වැඩ හෝ සැපයුම් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ගිවිසුම් ප්‍රකාරව සතුටුදායක ලෙස වැඩකර තිබෙන බවට සහතිකයක් මත ගෙවීම් කළ යුතු වුව ද, රු.636,022ක් වූ අලුත්වැඩියාවන් 16කට අදාළව එම කාර්යයට අදාළ වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකයක් ලබා ගැනීමකින් තොරව ගෙවීම්කර තිබුණි.	සටහන්කර ගතිමි. ඉදිරියේ සියලුම අලුත්වැඩියාවේ සඳහන් ගෙවීම් කිරීමේ දී මුදල් රෙගුලාසි අනුව ගෙවීම් කිරීමට කටයුතු කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකයක් මත ගෙවීම් සිදුකළ යුතු ය.
(ii) මු.රෙ. 237(ආ)	ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබී ඇති බවට ද, අදාළ බඩු ලේඛනයෙහි, තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත්කර ඇති බවට ද සහතිකයක් ඇමිණිය යුතු වුව ද, සභාවේ රු.886,621ක් වූ මිලදීගැනීම් 08ක දී උක්ත විධිවිධානයන් ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	සටහන්කර ගතිමි. ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේ දී මුදල් රෙගුලාසි විධිවිධාන සැලකිල්ලට ගෙන ගෙවීම් කිරීමට සටහන්කර ගතිමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ ලැබී ඇති බවට තහවුරුවක් ලබාගැනීමට කටයුතු කළ යුතු ය.

(ඈ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008	රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීම සහ ඒ සඳහා	පුරවැසි ප්‍රඥප්තිය මේ දක්වා සකස්කර නොමැති අතර, ඉදිරියේ දී පුරවැසි ප්‍රඥප්තිය සකස්කිරීමට කටයුතු කරනු	යොමුගත චක්‍රලේඛය අනුව පුරවැසි ප්‍රඥප්තිය සකස්කිරීමට

	(I) දරන චක්‍රලේඛය	සම්බන්ධවන්නා වූ පාර්ශවයන් අතර මනා අවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සිදුකළ යුතුව තිබුණ ද, කොමිෂන් සභාව විසින් එවැනි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් හඳුන්වාදීම සිදුකර නොතිබුණි.	ලැබේ.	කටයුතු කළ යුතු ය.
(ඉ)	**රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**			
	(i) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය සහ 2004 ජූලි 29 දිනැති අංක PED 25 දරන චක්‍රලේඛය	රජයේ අමාත්‍යාංශ, රජයේ සංස්ථා හා රජයට අයත් සමාගම් විසින් සිය අරමුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ හෝ උචිත අමාත්‍යවරයාගේ අනුමැතියක් ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ආයෝජනයකර තිබූ රු.9,144,650ක් වූ ස්ථාවර තැන්පතු සඳහා උක්ත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	මෙම අයෝජන ආයතනයේ සේවය කරනු ලබන සේවකයන්ගේ පාරිතෝෂික මුදල් ගෙවීමේ හදිසි අරමුදල් අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඊට පිළියමක් ලෙස පවත්වාගෙන යනු ලබන ආයෝජනයකි. භාණ්ඩාගාරය හෝ විගණනය විසින් මේ සම්බන්ධයෙන් ලබාදෙන ඉදිරි උපදෙස් මත මෙම ආයෝජන සම්බන්ධයෙන් ආයතනය ක්‍රියා කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වමි.	යොමුගත පනත හා චක්‍රලේඛය අනුව ආයෝජන සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු ය.

(ii)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයේ (පොදු ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය) 2.3 ඡේදයෙහි උපායමාර්ගික සැලැසුම්කරණය යටතේ වන උපලේඛන 1හි 3 ඡේදය	ප්‍රධාන අයවැය ලේඛනයට පුරෝකථනය කරන ලද ආදායම් ප්‍රකාශනය, පුරෝකථනය කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා පුරෝකථනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුළත් විය යුතු වුවත්, කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලද ප්‍රධාන අයවැය ලේඛනයට ඉහත ලේඛන ඇතුළත්කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට අයවැයගත ආදායම් ප්‍රකාශය, අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන අයවැය ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහිතව පිළියෙල කිරීමට කටයුතු කොට ඇත.	යොමුගත මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු ය.
(ඊ)	2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද ලිපිය	කොමිෂන් සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරින් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙලකර නොතිබුණි.	සංවර්ධන නිලධාරින් පත්කිරීමට පියවරගත් අතර, ආයතනයේ රාජකාරී පරාසය තුළ ඊට අදාළව කටයුතු කරමින් සිටී.	යොමුගත ලිපිය අනුව කටයුතු කළ යුතු ය.

1.8 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
කොමිෂන් සභාව විසින් ලංකා බැංකුවේ අලුත්කඩේ ශාඛාවේ පවත්වාගෙන යන යනු ලබන බැංකු ජංගම ගිණුමේ 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 පුරාම රු.150,000 සිට රු.26,000,000ක් අතර, මුදලක් පැවති අතර, මේ හේතුවෙන් ආයතනයේ අතිරික්ත මුදලක් නිෂ්කාර්යව බැංකු ගිණුමේ පැවතුණි.	ඉදිරියේ ආයතනයේ අරමුදල් කළමනාකරණය කිරීමේ දී ප්‍රශස්ථ මුදල් ප්‍රමාණයන් පමණක් බැංකු ජංගම ගිණුම තුළ පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා තිබුණි.	මුදල් නිෂ්කාර්යයව පවත්වා නොගත යුතු ය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.30,741,357ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.8,802,344ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,939,013ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු.36,049,231කින් ඉහළයාමට සාපේක්ෂව වියදම් රු.57,988,243කින් ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට ක්‍රියාවිරහිත තත්ත්වයේ පවතින රු.229,275ක වටිනාකමකින් යුත් කාර්යාල උපකරණ 03ක් සහ ධාවන තත්ත්වයේ නොපවතින රු.2,500,000ක වටිනාකමකින් යුත් ත්‍රීරෝද රථ 05ක් ඉවත්කිරීමට කටයුතුකර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 07ට අනුව වත්කමක පිරිවැය සහ සමුච්චිය ක්ෂය ඉවත්කළ යුත්තේ වත්කම බැහැරකරන අවස්ථාවේ දී බැවින්, මෙම වත්කම් ආයතනයෙන් බැහැර කොට නොමැති අතර, අදාළ වත්කම් ආයතනයේ පවතී. මෙම වත්කම්වල භාවිතය සහ ඉදිරි ඵලදායී ජීවකාලය පිළිබඳව යළි තක්සේරුවට අදාළව විශේෂඥ සහ දැනුම ඇති පාර්ශවයන්ගෙන් යුත් කමිටුවක් මගින් වාර්තාවක් ලබාගත යුතු අතර, එකී කමිටු නිර්දේශ මත අදාළ ඉදිරි කටයුතු සිදුකිරීමට සටහන්කර තබමි.	කාර්යාල උපකරණ හා ත්‍රීරෝද රථවල භාවිතය හා ජීවකාලය පිළිබඳ සමාලෝචනයක් සිදුකළ යුතු ය.
(ආ)	ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP JURE-LOA) සමග ඇතිකරගත් එකඟතා ගිවිසුම ප්‍රකාරව සංශෝධිත ජාතික නීති ආධාර ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම එළිදැක්වීම දෙවන සහ තෙවන කාර්තු තුළ ද, පරිත්‍යාගශීලී සම්බන්ධීකරණ රැස්වීම් දෙවන කාර්තුව තුළ සහ ඇපදීමෙන් ඔබ්බට අපරාධ කාරණා සඳහා ගාස්තු කාලසටහනක් සකස්කිරීම සහ නඩු සඳහා අදාළ සහාය දීම සඳහා ප්‍රවර්තන වර්ෂය තුළ කිසිදු පියවරක්ගෙන නොතිබුණි. ඒ සඳහා පිළිවෙලින් රු.2,249,000, රු.180,000 සහ රු.637,500 වෙන්කර තිබුණු අතර, UNDP ආයතනය විසින් එහි තෙවන වාරිකය 2024 නොවැම්බර් 29 දින	අධිකරණ අමාත්‍යාංශය විසින් සංශෝධිත ජාතික නීති ආධාර ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම නියමිත පරිදි සංශෝධනයකර කැබිනට් අනුමැතිය සඳහා නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතුවෙන් සංශෝධිත ජාතික නීති ආධාර ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම එළිදැක්වීමට නොහැකි වී ඇත.	අදාළ කාර්යයන් නිසිකාලවකවානු තුළ කඩිනමින් සිදු කිරීමට සැලසුම් කළ යුතු ය.

	කොමිෂන් සභාව වෙත ලැබී තිබූ නමුත්, උක්ත කාර්යයන් සිදුනොකිරීම නිසා 2024 දෙසැම්බර් 08 දින එම මුදල් නැවත භාණ්ඩාගාරයට යවා තිබුණි.		
(ඈ)	නීති ආධාර සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පළමු කාර්තු 03 තුළ, ගිවිසුමට ප්‍රකාරව රු.16,830,000ක් වෙන්කර තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දින වන විට, ඊට අදාළ ක්‍රියාකාරකම් සඳහා රු.13,035,683 ක වියදමක් දරා තිබුණි. ඒ අනුව සමස්ත වෙන්කරන ලද අරමුදල් ප්‍රමාණයෙන් සියයට 23 ක් 2024 දෙසැම්බර් 31 දිනය වන විටත් උපයෝජනය වී නොතිබුණි.	ව්‍යාපෘතිය කාර්තු 04ක් සඳහා ක්‍රියාත්මක කිරීමට ගිවිසුම්ගතව තිබූ අතර ගිවිසුමට අනුව ඊළඟ කාර්තුව සඳහා මුදල් ඉල්ලීමට නම් පෙර කාර්තුව සඳහා ලද මුදලින් සියයට 80ක් එම කාර්තුවට අදාළ ව්‍යාපෘති සඳහා වැයකර තිබිය යුතු ය. නීතිමය දැනුවත් කිරීම හා නීති ආධාර සායන සඳහා එක් වැඩසටහනකට රුපියල් රු.66,000ක මුදලක් වෙන් කළ අතර හැම වැඩසටහනකටම රු.66,000ක මුදලින් යම් අගයන් වියදම් වී නොමැතිව ඉතිරි වී ඇති අතර එම මුදල ශේෂය ලෙස ඉතිරි වෙයි.	වෙන්කරන ලද අරමුදල් නිසිපරිදි උපයෝජනය කළ යුතු ය.
(ඇ)	නීති ආධාර ලබාදීම වඩා විධිමත්ව සිදුකිරීමට හා මහජනයාට වඩා වැදගත් වන ආකාරයේ ඵලදායී සේවයක් ලබාගැනීම සඳහා මෙම කටයුතු අධීක්ෂණය කිරීමට හැකිවන ආකාරයේ ක්‍රමවේදයක් සකස්කිරීම සඳහා 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව ඇතත්, ජාතික නීති ආධාර ප්‍රතිපත්තිය සකස්කිරීම 2024 දෙසැම්බර් 31 දින වන තෙක් අවසන්කර නොතිබුණි.	මෙය බහුපාර්ශවීය කාර්යයන් වන අතර, විවිධ සංවාදයන් මේ සම්බන්ධයෙන් සිදුකරමින් අවශ්‍ය කටයුතු කරමින් පවතී.	ජාතික නීති ආධාර ප්‍රතිපත්තිය සකස්කිරීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	වර්තමානය වන විට කොමිෂන් සභාවට නිලවෙබ් අඩවියක් නොපැවතුණි. මීට පෙර පැවති වෙබ්අඩවිය තාක්ෂණික සේවා සැපයුම අවසන්වීමෙන් එහි ක්‍රියාකාරීත්වය කල්ඉකුත් වී ඇති බවත් හා UNDP-JURE ව්‍යාපෘතිය මගින් පරිත්‍යාගයක් ලෙස නව වෙබ්අඩවියක් වර්තමානයේදී නිර්මාණය කරන බවත් විගණනය වෙත දන්වා ඇති නමුත්, මේ වන තෙක් නිලවෙබ් අඩවිය නිර්මාණය කර අවසන්කර නොතිබුණි.	එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) යටතේ ක්‍රියාත්මක JURE ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ කටයුතු දැනට අවසන් අදියරේ පවතී.	නිලවෙබ් අඩවිය නිර්මාණයකර අවසන් කළ යුතු ය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජනවාරි 01 වන දින වන විට කොමිෂන් සභාව සතුව ඉදිරියට ගෙන ආ නඩු 38,905ක් වූ අතර, 2024 වර්ෂය තුළ ඉන් නඩු 23,709ක් පමණක් නිරවුල්කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂය ආරම්භයේ පැවති නඩුවලින් 2024 දෙසැම්බර් 31 දින විට නිරවුල් නොවී පැවති නඩු සංඛ්‍යාව සියයට 39ක් විය.	නඩු කල්යාම සහ ප්‍රමාදවීම නීති ආධාර කොමිෂමේ පාලනයේ පරිබාහිර කටයුත්තක් වන බැවින්, එම නඩු ප්‍රමාණයම පවතී. තව ද, නඩු පැවරීම සහ අවසන් කිරීම සාමාන්‍ය ක්‍රියාවලියක් ලෙස පවතින බැවින් ඉතිරිව පවතින ශේෂයන් පවතී.	නිරවුල් නොවූ නඩු නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	2024 වර්ෂය තුළ ගොනු කරන ලද නඩු සංඛ්‍යාව 12,362ක් වූ අතර, එම නඩුවලින් නිරවුල් වූ නඩු පිළිබඳ තොරතුරු විගණිත දිනය වන විටත් ඉදිරිපත්කර නොතිබුණි.	වාර්ෂික අවසන් වාර්තා සැකසීමට දිවයින පුරා පිහිටි නීති ආධාර මධ්‍යස්ථානවලින් තොරතුරු ලබාගෙන සිදුකරනු ලබයි. ඒ අනුව 2024 වර්ෂය සඳහා අධිකරණමය කටයුතු සම්බන්ධව සංඛ්‍යාත්මක අගයන් ඉදිරිපත් කරමි.	නියමිත කාලවකවානු තුළ විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ආ) ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගතකර තිබිය යුතු වුවත්, කොමිෂන් සභාව විසින් 2024 වර්ෂයේ පිළියෙල කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි 2024 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන කටයුතු පමණක් අන්තර්ගතකර තිබුණි.	2025 - 2027 වර්ෂය සඳහා ප්‍රසම්පාදනයන් සිදුකිරීමේ දී ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කොට ඒ අනුව කටයුතු කිරීමට කටයුතු කරමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව වසර 03ක කාලයකට ප්‍රසම්පාදන සැලැස්ම සකස්කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළ දී නිතිපතා යාවත්කාලීන කරනු ලැබිය යුතු වුවත්, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) ප්‍රකාරව කටයුතු කිරීමට ඉදිරියේ දී ක්‍රියා කරමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු ය.

	ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකිව තිබුණි.		
(ඇ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2(අ) ප්‍රකාරව එක් එක් ප්‍රසම්පාදනයන් ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහනක් කොමිෂන් සභාව විසින් 2024 වර්ෂය සඳහා පිළියෙලකර නොතිබුණි.	2025 වර්ෂයේ ප්‍රසම්පාදන කාලරාමුවක් පිළියෙල කොට ඒ අනුව කටයුතු කිරීම සිදුකරමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.
(ඈ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1(ඊ) ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාව සහ නිර්දේශ සමාලෝචනය කිරීම සහ 8.1 මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව නිර්ණය කිරීම/නිර්දේශ කිරීම ප්‍රසම්පාදන කමිටුවල කාර්යභාරයක් වන නමුත්, කොමිෂන් සභාවෙහි ප්‍රසම්පාදන කමිටුවක් නොමැතිවීම හේතුවෙන් සියලුම ප්‍රසම්පාදනයන්හි තාක්ෂණික කමිටුවෙහි තීරණ මත පමණක් පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතකර මිලදීගැනීම් සිදුකර තිබුණි.	2025 වර්ෂයේ දී ප්‍රසම්පාදන කමිටු විෂයභාර අමාත්‍යාංශ ලේකම් අනුමැතිය යටතේ පිහිටුවා ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතුවල දී තාක්ෂණික කමිටුවේ නිර්දේශ සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 6.3.6හි සඳහන් ආකෘතිපත්‍රයක වාර්තාකළ යුතු අතර, එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලුම සාමාජිකයන් විසින් අත්සන්කළ යුතු වුව ද, රු.177,365ක වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ මිලදීගැනීමේදී එපරිදි කටයුතුකර නොතිබුණි.	2025 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටු මගින් අදාළ කාර්යභාරය සිදුකරනු ලැබේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ලංසු විවෘත කිරීම ලේඛනගත කිරීමට කටයුතු කළ යුතු ය.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 152ක් වුව ද, තථ්‍ය කාර්ය මණ්ඩලය 120ක් වූයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05ක නිලධාරීන් 32ක් පුරප්පාඩුව පැවතුණි. ඒ අනුව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (නීති), අධ්‍යක්ෂ (පාලන/මූල්‍ය සහ කොමිෂන් සභාවේ ලේකම්), සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රාදේශීය) යන තනතුරු ද, නීති නිලධාරීන් 28දෙනෙකු ද, පුරප්පාඩු පැවතුණි.	පුරප්පාඩු අනුමැතිය සඳහා සියලු ආකාරයේ ඉල්ලීම් අධිකරණ අමාත්‍යාංශය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත යොමුකර ඇත. එහෙත් මෙතෙක් අනුමැතිය ලැබී නොමැත.	පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය පියවරගත යුතු ය.

4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) ඡේදය ප්‍රකාරව කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා එම සභාවේ පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන තමන්ගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු නමුත්, කොමිෂන් සභාව විසින් අනුමත කාර්යමණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමතකර ගෙන නොතිබුණි.	අභ්‍යන්තර විගණන තනතුර ඇති කිරීම සඳහා බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට අවශ්‍ය ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පියවර ගනිමින් සිටියි.	2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පිරියත හා උපකරණ නඩත්තු සඳහා රු.2,000,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු ප්‍රතිපාදනයක් වියදම්කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	අවශ්‍ය ප්‍රමාණයට ප්‍රතිපාදන වෙන් කරගත යුතු ය.